කයිට්ස් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 19 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කයිට්ස් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වටිනාකම රු.50,070,600 ක්වූ දේපළ 22 ක අයිතිය සභාවට පවරා නොතිබුණි. එනමුත් ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පරිත්‍යාග ලෙස සභාවට නිකුත් කළ වටිනාකම රු.15,872,600 ක්වූ වාහන 12 ක් සභාවට අයත්ව නොතිබුණි. එනමුත් ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් වාහන වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 අනුකූල නොවීම

-----------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---------------------------------------------------------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව<br>-------------------------------- | අනුකූල නොවීම<br>--------------------- |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>II පරිච්ඡේදයේ රීති 4 | සමාලෝචිත වර්ෂය තුළදී සභාව දේපළ තක්සේරු කිරීම හා තක්සේරු බදු අයකිරීම සිදුකර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ<br>2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | පසුගිය වසරක කාල පරිච්ඡේදය තුළ සභා වාහන 05 ක ඉන්ධන දහනය පරීක්‍ෂා කර නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2006 ජුනි 26 දිනැති අංක13/2008 | වාහන දෛනික ධාවන සටහන් පසුව එළඹෙන මාසයේ 15 වෙනි දිනට පෙර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | උතුරු පළාත් මුදල් චක්‍රලේඛය<br>2017 මාර්තු 07 දිනැති අංක පීඑස්/01/2017 | පරිපාලනමය වශයෙන් හෝ බලතල පැවරීම් පරිදි මුදල් හා ගබඩා බඩු ලබාගැනීම සහ ඒවා සුරක්ෂිතව භාරයේ තබාගැනීමේ වගකීම භාර නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,191,680 ක්වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.10,363,038 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්‍ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ------------ | --------------- | ----------- | ------------- | --------------- | -------------- | ---------- | ----------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 3,625,559 | - | 2,677,922 | 6,268 | 2,302,000 | - | 3,013,593 | 8,450 |
| (ii) කුලී | | - | | | - | - | | - |
| (iii)බලපත්‍ර ගාස්තු | 376,000 | - | 322,999 | - | 347,000 | - | 345,205 | - |
| (iv)වෙනත් ආදායම් | 6,769,400 | - | 9,112,957 | - | 6,846,100 | - | 11,400,805 | 6,142,890 |
| එකතුව | 10,770,559 | - | 6,424,786 | 6,418,520 | 9,495,100 | - | 14,759,601 | 6,151,140 |

2.2.2 මුද්දර ගාස්තු
---------------

2017 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින්, රු.362,400 ක්වූ මුද්දර ගාස්තු දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්යසාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව, සභාව විසින් මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා හා පොදු මංමාවත් පිළිබඳව සියලු කරුණු පාලනය කිරීම් සහ පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම්, සුහසාධනය සහ ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවූ කරුණු පහත පරිදි විය.

කාර්යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්
-----------------------------------

හෙක්ටයාර් 0.3572 ප්‍රමාණයෙන් යුත් රජයේ ඉඩමක් ජේ/49 ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ සාප්පු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සභාවට වෙන්කරදී තිබුණි. එසේවුවත් සභාවට අයිතිය පැවරීමේ කටයුතු ප්‍රමාදවී ඇති බැව් නිරීක්ෂණය විය.

3.2 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

සභාව මානව සම්පත් විධිමත්ව බඳවා ගැනීම හා යෙදවීම සිදුකර නොමැති බැව් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 21 විසින් නිම කළ යුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
---------------------------

පසුගිය වසර 05 ක් තිස්සේ සභාවට අයත් සුසාන භූමි 16 ක දේහ ආදාහනය කිරීම වෙනුවෙන් සුසාන භූමි ගාස්තු අයකර ගැනීම සඳහා සභාව අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

-------------------------------

ඌන උපයෝජිත වත්කම්

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් දේවාරාදම් බෝට්ටුව වසර 04 ක් තිස්සේ කයිට්ස් වරාය ප්‍රාදේශයේ අක්‍රීයව පැවතුණි.

(ආ) සභාවට අයත් කයිට්ස්හි පිහිටි නව වෙළඳ සංකීර්ණයේ ඉහළ මාලයේ පිහිටි කඩකාමර 03 ක් පසුගිය වසර 10 ක් තිස්සේ අක්‍රීයව පැවති බැව් නිරීක්ෂණය විය.

4. වගකීම්භාරයේ සහ යහපාලනය

----------------------------------

අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.36,995 සිට රු.2,699,801 හෙවත් සියයට 46 සිට සියයට 78 දක්වා සහ අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.2,064 සහ රු.10,996,637 හෙවත් සියයට 0.39 සිට සියයට 29 දක්වා පරාසවල විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| වත්කම් | ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කිරීමට අසමත්වීම. |